(51)

**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**

උපදේශක චක්‍රලේඛය2004/පුස/02(අ)(සංශෝධිත 2020)

**පළාත් පාලන ආයතනවලට සම්බන්ධ මහජන පුස්තකාලයන්හි "ඔක්තෝබර් - ජාතික කියවීමේ මාසය වැඩසටහන" ක්‍රියාත්මක කිරීම**

## 01. හැඳින්වීම

2004 වසරේ සිට ඔක්තෝබර් මාසය ජාතික කියවීමේ මාසය ලෙස රජය මගින් ප්‍රකාශයට පත් කර ඇත. 2020 ඔක්තෝබර් මාසයට යෙදෙන ජාතික කියවීමේ මාසයට සමගාමීව කියවීම් ප්‍රවර්ධනය සඳහා **විශේෂ වැඩසටහන්** සහ **විශේෂ ව්‍යාපෘති** ක්‍රියාත්මක කරන මෙන් සියලුම මහජන පුස්තකාලවලින් ඉල්ලා සිටිනු ලැබේ. 2018 වර්ෂයේ සිට ජාතික කියවීමේ මාසය සඳහා නිශ්චිත තේමාවක් යටතේ වැඩසටහන් සංවිධානය කිරීමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය කටයුතු කරන ලදී. ලොව පුරා ව්‍යාප්ත කොවිඩ් -19 වසංගතය හේතුවෙන් බිඳ වැටෙන රට නැවත සංවර්ධනයට යොමු කිරීම සඳහා මහජනතාව දැනුවත් කිරීම තුළින් ස්වයංපෝෂිත දැයක් බිහිකරනු වස් " **කියවමු පොතක් නංවමු රටක්** "යන තේමාව පදනම් කරගනිමින් මෙම වසරේ ජාතික කියවීමේ මාසය වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නියමිත ය .මෙම යෝජිත වැඩසටහන් 2020.08.01 දින සිට 2021.01.31 දින දක්වා ක්‍රියාත්මක කිරීම කළ යුතුය.

## 02.ව්‍යාපෘති කමිටුව

මෙහිදී වැඩසටහන් සංවිධානය කිරීම සඳහා කියවීමේ මාසයේ ව්‍යාපෘති කමිටුවක් පත් කර ගැනීම සුදුසුය. දැනට පුස්තකාල කමිටුවක් තිබේ නම් එම කමිටුව මඟින් හා පාඨක සමාජයේ සහභාගිත්වයෙන් මෙම කටයුත්ත සිදු කළ හැක. මේ සඳහා ප්‍රධාන මෙහෙයුම් කමිටුවක් පත් කර ගැනීමද සුදුසු වන අතර එහි සංයුතිය පහත පරිදි විය යුතුය.

- ආයතන ප්‍රධානියා හෝ නියෝජ්‍ය ප්‍රධානියා - කමිටු සභාපති
- නාගරික කොමසාරිස් හෝ පළාත් පාලන ආයතනයේ ලේකම් - උප සභාපති
- පුස්තකාලයාධිපති/භාරකරු - කමිටු ලේකම්
- ප්‍රජා සංවර්ධන නිලධාරී
- මහජන සෞඛ්‍ය පරීක්ෂක
- කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරී
- ප්‍රාදේශීය රෝහල් ප්‍රධානී හෝ නම් කරන නියෝජිතයෙක්
- කලාප අධ්‍යාපන කාර්යාලයේ ගුරු උපදේශකවරයෙක්
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ළමා සංවර්ධන නිලධාරී

## 03. ක්‍රියාත්මක කළ හැකි විශේෂ වැඩසටහන්

- තේමාවට අදාළව පුස්තකාලය සතු විවිධ ග්‍රන්ථ එකතුව හඳුනා ගැනීම
  ලෝක යුද්ධ/වසංගත තත්වයන්ගෙන් පසු විවිධ රටවල් සංවර්ධිතව නැගී සිටීම පිළිබඳ රචනා වී ඇති කෘති
  උදා : චරිතාපදාන මහේන්ද්‍ර ටාටා,ලී ක්වාන් යූ, මහතීර් මොහොමඩ්,ඈන් ෆ්‍රෑන්ක්.
- එම ග්‍රන්ථ එකතුව විශේෂිත ක්‍රමයක් යටතේ සංවිධානය කර වර්ෂය පුරා ප්‍රචාරණය කිරීම සහ ප්‍රදර්ශනය කිරීම.
- පරිසර,කෘෂිකර්ම සහ නව නිර්මාණ සම්බන්ධව කටයුතු කරන දේශීය හා ජාත්‍යන්තර ආයතන හා සංවිධාන පිළිබඳ ලැයිස්තු සකස් කිරීම.
  උදා : කාර්මික තාක්ෂණ ආයතනය( ITI )/නව නිපැයුම්කරුවන්ගේ සංගමය
- යෝජිත තේමාවට අදාළව දැනට පුස්තකාල එකතුවේ නොමැති දේශීය / විදේශීය ග්‍රන්ථ හඳුනා ගැනීම සහ එම ග්‍රන්ථ අත්පත් කර ගැනීමට කටයුතු කිරීම.
- ප්‍රදේශයේ සිටින ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි පාරම්පරික හා ආයුර්වේද වෛද්‍යවරුන් පිළිබඳ තොරතුරු ලේඛන හා නාමාවලී සකස් කිරීම. ඒවා ප්‍රදේශයේ ජනතාවට දැනගැනීම සඳහා සිදු කෙරෙන දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- විවිධ රෝගාබාධ වළක්වා ගැනීම සහ නිවාරණය කිරීම සඳහා අනුගමනය කරන අත්බෙහෙත්, දේශීය වෙද හෙදකම්, ජන ශ්‍රැති පිළිබඳ ලියැවුණු කෘති/ලිපි එකතු සකස් කිරීම හා ඒවා සමාජ මාධ්‍ය මගින් ප්‍රචලිත කිරීමට පියවර ගැනීම හා සමාජ මාධ්‍ය නොමැති පිරිස් සඳහා පත්‍රිකා මගින් තොරතුරු බෙදා දීම.
- ආහාර සුරක්ෂිතතාව වෙනුවෙන් ගෘහ පරිභෝජනය සඳහා සුදුසු වන භෝග හා ශාක වර්ග පිළිබඳ දැනුවත් කිරීම,එම භෝග වගා කිරීම පිළිබඳ අවශ්‍ය තොරතුරු බෙදා හැරීම.
  උදා : වගා මාධ්‍ය සකස් කිරීම / පලිබෝධ පාලනය
- පාඨක සමාජයේ සෑම පාඨකයෙකුගේම නිවාස ආශ්‍රිතව නාගරිකව නම් බඳුන්ගතව හෝ ග්‍රාමීයව නම් භූමියෙහි ගෙවතු වගා කටයුතු සිදුකිරීමට පෙළඹවීම හා ගෙවතු වගා තරඟ සංවිධානය කිරීම.
  ( පුස්තකාලය ආශ්‍රිතව ආදර්ශ ගෙවත්තක් සකස් කිරීම)
- අතිරික්ත භෝග අලෙවි කිරීම සඳහා අවශ්‍ය වෙළඳපොළ පුස්තකාල භූමිය ආශ්‍රිතව සලසා දීම.
- අන්තර්ජාලය හා සමාජ මාධ්‍ය ඔස්සේ ඉහත ව්‍යාපෘති පිළිබඳ විස්තර හා තොරතුරු ප්‍රචාරය කිරීම.
- දේශීය කර්මාන්ත ආශ්‍රිතව විවිධ ස්වයං රැකියා සඳහා අවශ්‍ය දැනුම ලබාගැනීම සඳහා මග පෙන්වීම.
  උදා : පන් /කොහු/ වේවැල් / කල්තබා ගතහැකි ආහාර ...
- විදේශීයව ආනයනය කරනු ලබන , දේශීයව වගා කළ හැකි ආර්ථික භෝග වගා කිරීම පිළිබඳ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැනුවත් කිරීමට කටයුතු කිරීම,
- හරිත පුස්තකාල සංකල්පයට අදාළව පරිසරය ආරක්ෂා කිරීම සම්බන්ධව සිදුකළ හැකි ක්‍රියාකාරකම් පිළිබඳ සම්මන්ත්‍රණ/ සාකච්ඡා/කථිකා වැඩසටහන් සංවිධානය කිරීම.
- පාඨක නිර්මාණශීලීත්වය එළිදැක්වෙන නිර්මාණ ඇතුළත් සහරා, බිත්ති පුවත්පත් එළි දැක්වීම.
- තේමාවට අදාළව විවිධ තරග සංවිධානය කිරීම( රචනා තරග ,චිත්‍ර තරග)

- තේමාවට අදාළව පෝස්ටර් නිර්මාණය.
- නව සාමාජිකයන් බඳවා ගැනීම.
- නොමිලයේ පුස්තකාල සාමාජිකත්වය පිරිනැමීම.
- පුස්තකාලය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ප්‍රදේශයේ හොඳම පාඨකයා තේරීම.
- ජංගම පුස්තකාල සේවා පැවැත්වීම.
- සෞඛ්‍යාරක්ෂිත ක්‍රම අනුගමනය කරමින් දරුවන්ගේ රසඥතාවය ඉහළ නැංවීම සඳහා කතන්දර පැය, ළමා චිත්‍රපට, ළමා නාට්‍ය වැනි රසවින්දනාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ප්‍රදේශයේ අනෙකුත් පුස්තකාල සමඟ කියවීම් ප්‍රවර්ධනය සඳහා සහයෝගිතා වැඩසටහන් සංවිධානය කිරීම.
- පළාත් පාලන බල ප්‍රදේශයට අයත් සෑම නිවසකම පුස්තකාලයක් යන සංකල්පය තේමා කොට ගනිමින් අවම වශයෙන් පොත් රාක්කයකින් සමන්විත ගෘහස්ත පුස්තකාලයක් ආරම්භ කිරීම සඳහා එලදායී ප්‍රචාරාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පුස්තකාලයේ මුහුණු පොතට (face book) මෙතෙක් සම්බන්ධ වී නොමැති පාඨකයන් හඳුනා ගෙන ඔවුන් ඒ සඳහා සම්බන්ධ කර ගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ එහි කියවීම ප්‍රවර්ධනය සම්බන්ධ උධෘත හා අදහස් හුවමාරු කර ගැනීම.
- පුස්තකාලය විසින් ක්‍රියාත්මක කරනු ලබන විවධ වැඩසටහන් පිළිබඳ තොරතුරු විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය තුළින් ප්‍රචාරය කිරීමට කටයුතු කිරීම.
- ප්‍රාදේශිය වශයෙන් නව නිපැයුම්,නව සංකල්ප හා අදහස් ඉදිරිපත් කරන දරුවන්, සිවිල් ක්‍රියාකාරීන් ඇගයීම සඳහා කටයුතු කිරීම.
- ළමා කියවීම් ප්‍රවර්ධනය සම්බන්ධ වෙනත් නිර්මාණශීලි වැඩසටහන් සංවිධානය කිරීම.
- ප්‍රදේශයේ රෝහල සමග සම්බන්ධ වී කියවීම හා තොරතුරු ප්‍රචාරය සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## 04. වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් යාවත් කාලීනව නිකුත් කර ඇති කොවිඩ් -19 (COVID -19)සෞඛ්‍ය මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කිරීම සුදුසු වේ. අදාළ උපදෙස් සඳහා පහත වෙබ් යොමුව පරිශීලනය කරන්න.

http://www.health.gov.lk/moh_final/english/article_read_more.php?id=885

## 05. අරමුදල්

මේ සඳහා විශාල වශයෙන් මුදල් යෙදවීම් සිදු නොකළ යුතුය. අවශ්‍ය අරමුදල් සපයා ගැනීම අදාළ පළාත් පාලන ආයතනය මඟින් හෝ පුස්තකාල මඟින් සිදු කළ හැකිය.

## 06. වාර්තාව සකස් කිරීම

. සිදු කරන ලද සියලුම වැඩසටහන් පිළිබඳ පැහැදිලි ක්‍රමවත් වාර්තාවක්(මුද්‍රිත/සංයුක්ත තැටි) සකස් කර අදාළ පළාත් පාලන ආයතනයේ ප්‍රධානියාගේ නිර්දේශ සහිතව ***2021පෙබරවාරි මස 28*** වන දින හෝ ඊට පෙර ***අංශ ප්‍රධාන, ව්‍යාප්ති සේවා අංශය, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, අංක 14, නිදහස් මාවත, කොළඹ 07*** යන ලිපිනයට වාර්තාව එවිය යුතුය.

- ජයග්‍රාහී පුස්තකාල තෝරා ගැනීම සඳහා මූලිකව සලකා බලනු ලබන වාර්තාව සකස් කිරීමේදී, ඉහත දක්වන ලද වැඩසටහන් ඇතුළුව කියවීම් ප්‍රවර්ධනය සම්බන්ධයෙන් සිදුකරන ලද වැඩසටහන් සඳහා පමණක් ලකුණු ලබාදීමේ ක්‍රමවේදයක් අනුගමනය කරනු ලැබේ.එබැවින් පුස්තකාලය විසින් කරන ලද වෙනත් ප්‍රජා සේවාවන් සම්බන්ධ තොරතුරු වාර්තාවට ඇතුළත් නොකළ යුතුය.
උදා: ශ්‍රමදාන / දන්සැල් / ලේ දන්දීම්

- වාර්තාව සකස් කිරීමේදී පිටකවරය /පොතේ බැම්ම වැනි දේ සඳහා අමතර කාලයක් හා මුදලක් වැය කිරිමඅවශ්‍ය නොවේ. පුස්තකාලය විසින් ජාතික කියවීමේ මාසයේ තේමාවට අනුව සිදුකරන ලද වැඩසටහන් සහ අදාළ වර්ෂය පුරා සිදුකළ වැඩසටහන්වල තොරතුරු වෙන් වෙන්ව **ඡායාරූප හා තහවුරු කළ හැකි වෙනත් සාධක සහිතව විධිමත් අයුරින් ඉදිරිපත් කිරීම** ප්‍රමාණවත්ය.

## 07. ඇගයීම

- ජාතික කියවීමේ මාසය 2020 ඵලදායි වැඩසටහන් ඉටු කළ පුස්තකාල වෙත 2021ජාතික කියවීමේ මාසය රාජ්‍ය උත්සවයේ දී ත්‍යාග, සහතිකපත් හා සම්මාන පිරිනමනු ලැබේ.ඇගයීම් කටයුතු පුස්තකාල මට්ටමින් සිදුකරන බැවින් එක් එක් පළාත් පාලන ආයතන සතු මහජන පුස්තකාල හා ශාඛා පුස්තකාල වෙන් වෙන් වශයෙන් වාර්තා එවිය යුතුය. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් අවසන් වශයෙන් තේරී පත්වන පුස්තකාල නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව අදාළ පුස්තකාලය සඳහා හිමිවන සම්මාන කවරේද යන්න තීරණය කරනු ලැබේ.

[signature]

සෝමපාල ගුණවර්ධන
සභාපති
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
14, නිදහස් මාවත
කොළඹ 07

සභාපති

විමසීම් - දුරකථන අංකය - 011-2698847

වෙබ් අඩවිය - www.natlib.lk